## 7. තිරොකුඩ්ඩ සූත්‍රය - ඛුද්දක නිකාය » ඛුද්දකපාඨපාළි

### 7. තිරොකුඩ්ඩසුත්තං

1. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති සන්ධිසිඞ්ඝාටකෙසු ච
ද්වාරබාහාසු තිට්ඨන්ති ආගන්ත්වාන සකං ඝරං.

2. පහූතෙ අන්නපානම්හි ඛජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ
න තෙසං කොචි සරති සත්තානං කම්මපච්චයා.

3. එවං දදන්ති ඤාතීනං යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන කප්පියං පානභොජනං.

4. ඉදං වො ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයො
තෙ ච තත්ථ සමාගන්ත්වා ඤාතිපෙතා සමාගතා

5. පහූතෙ අන්නපානම්හි සක්කච්චං අනුමොදරෙ.
“චිරං ජීවන්තු නො ඤාතී යෙසං හෙතු ලභාමසෙ.
අම්හාකං ච කතා පූජා” දායකා ච අනිප්ඵලා.

6. න හි තත්ථ කසී අත්ථි ගොරක්ඛෙත්ථ න විජ්ජති.
වාණිජ්ජා තාදිසී නත්ථි හිරඤ්ඤෙන කයාක්කයං.
ඉතො දින්නෙන යාපෙන්ති පෙතා කාලකතා තහිං.

7. උන්නමෙ උදකං වට්ඨං[4] යථා නින්නං පවත්තති
එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති.

---

1, 2, 3, විපශ්‍යිස්මිං විශ්වභුවික්‍රකුච්ඡන්දෙ
කාමකනකමුනිස්මිං කාශ්‍යපෙ
මහායශෙ ශාක්‍යමුනිස්මිං ගෞතමෙ
එතෙෂු බුද්ධෙෂු මහර්ධිකෙෂු
යා දෙවතා සන්ති අභිප්‍රසන්නා
වාඪම්පි තා රක්ෂන්තු ච කාරොන්තු

සවසත්‍යයතාං මානුෂියා ප්‍රජායෙ
යො ධර්මචක්‍රං අභිභූය ලොකං
ප්‍රවර්තීයති සර්වභූතානුකම්පී
එතාදෘශං දෙවමනුෂ්‍යශ්‍රෙෂ්ඨං
බුද්ධං නමස්‍යාම සුස්වස්ති හොතු.
ධර්මං නමස්‍යාම සුස්වස්ති හොතු.
සංඝං නමස්‍යාම සුස්වස්ති හොතු.

-(මහාවස්තු)

4. වුට්ඨං (සී. මු.

## 7. තිරොකුඩ්ඩ සූත්‍රය.

(ඥාතිප්‍රේතයෝ) තමන් පෙර වුසූ ගෙය කරා අවුත් බිත්තියෙන් පිටත්හි ද ගෘහසන්ධි හිත්තිසන්ධි සතරමංහන්දි තුන්මංහන්දි යන මේ තන්හි ද දොරබා නිසා ද සිටිත්.

2. බොහෝ වූ ආහාරපාන ද ඛාද්‍යභොජ්‍ය ද පිළියෙල ව ඇති කල්හි (පවා) ඒ ප්‍රේතලෝකයෙහි උපන් සත්ත්වයන්ගේ අකුශලකර්ම හෙතුවෙන් කිසි ම නෑදෑයෙක් ඔවුන් සිහි නො කෙරෙයි.

3,4,5. නෑයන් අතුරෙන් යම් කෙනෙක් ඔවුනට අනුකම්පා කරන්නාහු වෙත් ද, ඔහු තුමූ "මේ පින පරලොව ගිය අප නෑයනට වේවා. ඒ නෑයෝ සුවපත් වෙත්වා"යි කියා, ඔවුන් අවුත් සිටි කල්හි, ඒ නෑයන් උදෙසා පවිත්‍ර වූ ප්‍රණීත වූ කැප වූ ආහාර පාන දන් දෙත්. ඒ ඥාති ප්‍රේතයෝ ද ඒ දන් දෙන තැනට නොයෙක් දිශාභාගයෙන් අවුත් එක් රැස් වූවාහු, තමන් උදෙසා බොහෝ ආහාරපාන දෙනු ලබන කල්හි සකසා (කර්ම පල අදහා) පින් අනුමෝදන් කෙරෙත් (හෙවත් එය අනුව සතුටු වෙත්). "යම් කෙනෙකුන් නිසා (පින් අනුමෝදන් කළ) මෙ කෙණෙහි සම්පත් ලැබීමෝ ද, ඒ අප නෑයෝ බොහෝ කල් ජීවත් වෙත්වා. ඔවුන් විසින් දන් දී පින් පැමිණවීම් වශයෙන් අපට ද පූජා කරනු ලදී" යි ද තුති කෙරෙත්. ඒ දන් දුන් දායකයෝ ද ඵල රහිතයෝ නො වෙති.

6. ඒ ප්‍රේතලෝකයෙහි සී සෑමෙක් නැත්තේ ය. ගව පාලනයක් එහි නැත්තේ ය. (සම්පත් ලැබීමට හෙතු වූ) එබඳු වෙළෙඳාමෙකුත් නැත්තේ ය. රන්රිදියෙන් කරණ ගණුදෙනුවෙක් ද නැත්තේ ය. (හුදෙක්) මැරී ඒ ප්‍රේතවිෂයයට පැමිණියෝ මේ මිනිස්ලොව වසන නෑමිතුරන් විසින් දෙන ලද පිණෙකින් ඒ ප්‍රේතයොනියෙහි යැපෙත්.

7. යම්සේ උස් බිමෙක වට ජලය මිටි බිම කරා ගලා බසී ද, එ පරිද්දෙන් ම මේ මිනිස්ලොවෙහි දී ඥාත්‍යාදීන් විසින් දුන් දානය (එහි විපාක වශයෙන්) ප්‍රේතයන්හට පැමිණේ (ලැබේ).

http://www.thripitakaya.org/tipitakaya/Index/622?s=21197